


පාකෙන්හම් හි දුම්රිය කොරිඩෝරය දිගේ එල්-බීම් ස්ථාපනය කිරීම

SINHALESE

පාකෙන්හම්, 2023, ජූනි

# පාකෙන්හම් හි අපි බොහෝ වැඩ කොටසක් සිදුකරමින් සිටිමු

## වැඩ් යහපත සඳහා දුම්රිය හරහා දිවෙන පාර ඉවත් කිරීම සඳහා අපි තව අදියරක් ඉදිරියෙන් සිටිමු.

අප විසින් භයානක සහ ජනාකීර්ණ දුම්රිය හරහා දිවෙන පාරවල් තුනක් ඉවත්කර පාර හරහා දුම්රිය පාලමක් තැනීම මගින් සියළු වැඩ කටයුතු සම්බන්ධයෙන් අපි ඉදිරියෙන් සිටිමු.

පසුගිය මාසයේ මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ් වලට ඉහළින් එල්-බීම් ස්ථාපනය කිරීම හේතුවෙන් උසට තනනු ලබන දුම්රිය පාළමට හැඩය ලබා දීමට ආරම්භවී ඇත.

පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම්වල නව දුම්රිය ස්ථානවල වැඩ කටයුතු දිගටම සිදුවෙමින් පවතී. මේවා සම්පූර්ණවූ විට දුම්රිය ස්ථානවලට අමතර රථ ගාල් ඇතුළුව සාප්පු සංකීර්ණ සහ පළාතේ පහසුකම් වෙත වඩා හොඳ ප්‍රවේශයක් ලබා දෙයි.

උස් කර තනනු ලබන දුම්රිය පාළම මගින් එම්. සී.ජී. හයක ප්‍රමාණයක ඉඩකඩක් 2024 දී සම්පූර්ණ කරන විට ලබා දෙයි.

අප්‍රියෙල් මාසයේ පාළම් බීම් ස්ථාපනය කිරීම සඳහා මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ් වසා දමන ලද කාලයේදී ප්‍රජාවගේ ඉවසීම සම්බන්ධයෙන් අප විසින් ඔවුනට ස්තුති කළ යුතුය. මෙම දැවැන්ත පාළම් කොටස් නියම ස්ථානවල තැබීම වැදගත් සන්ධිස්ථානයකි.

ජූනි මාසයේ **24/7 පුරා සිදුකරන වැඩ කටයුතු** ඉදිරියට එන අතර - වැඩිදුර විස්තර සඳහා ඇතුලත බලන්න.

### මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් ඉවත් විය යුතු හේතුව

සෑම සතියේ දිනකම වාහන 63,000 ක් මෙම දුම්රිය හරහා දිවෙන පාර භාවිතා කරයි.

උදෑසන ජනාකීර්ණ වේලාවන්හි මිනිත්තු 30 කට වඩා වැඩි කාලයක් බූම් ගේට්ටු වසා ඇත

මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් ඔස්සේ දිනපතා 170 මෙට්රෝ සහ වී/ලයින් දුම්රිය ගමන් කරයි

සෑම දිනකම මගීන් 90,000 ක් ක්‍රේන්බර්න් - පාකෙන්හම් මාර්ගය භාවිතා කරයි

යාවත්කාලීන සඳහා අනුසන් කරන්න
levelcrossings.vic.gov.au



# 24/7 පුරා ජූනි මාසයේ කරන වැඩ කටයුතු

කණ්ඩායම දවස පුරා දුම්රිය පාළම ගොඩනැගීම, සංඥා ස්ථාපනය කිරීම සහ ඊස්ට් පාකෙන්හම් හි දුම්රිය පාර වැඩ කටයුතු සිදු කරන අතර ජූනි 8 වන බ්‍රහස්පතින්දා සිට ජූනි 21 වන බදාදා දක්වා බර්වික් සහ පාකෙන්හම් අතර දුම්රිය වෙනුවට බස් රථ ගමන් කරනු ඇත.

මෙම කලායේදී, ගොඩනැගීම් සිදු කරන වාහන සඳහා දුම්රිය කොරිඩෝව වෙත ආරක්ෂිතව යාමට ප්‍රවේශය දීම හේතුවෙන් සෑම දුම්රිය හරහා දිවෙන පාරකම සුළු ප්‍රමාද ඇතිවනු ඇත.  පුද්ගලික නිවෙස් සහ ව්‍යාපාර වෙත පයින් යන මගීන් සහ වාහන වෙත රථවාහන කළමණාකරණය කිරීම මගින් ප්‍රවේශය ලබා දෙනු ඇත.

බාධාවීම් සහ දුම්රිය වෙනුවට බස්රථ ලබාදීම සම්බන්ධ යාවත්කාලීන සඳහා **ptv.vic.gov.au/cranpak** වෙත පිවිසෙන්න.

## මාර්ග වෙත සිදුවන බලපෑම

දුම්රිය කොරිඩෝව හරහා 24/7 අපගේ වැඩ කටයුතු සිදුවන අවස්ථාවල, රේස්කෝස් රෝඩ්, මැක්ග්‍රෙගර් රෝඩ් සහ මේන් ස්ට්‍රීට් හි මාර්ග වසා තබනු ඇත.


සේවකයන් මැක්ග්‍රෙගර් රෝඩ් පාර කන්හම් හි එල්-බීම් ස්ථාපනය කිරීම

### යාවත්කාලීනව සිටින්න

මාර්ගවල ගමනාගමනයට සිදුවන බලපෑම සම්බන්ධව යාවත්කාලීනව සිටීම සඳහා පාකෙන්හම් දුම්රිය හරහා දිවෙන මාර්ග ඉවත් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ එස්.එම්.එස්. යාවත්කාලීන ලබා ගැනීම සඳහා **0428 581 917** වෙත **PAKENHAM** යනුවෙන් ටෙක්ස්ට් පණිවුඩයක් යවන්න, නැතිනම් **levelcrossings.vic.gov.au/subscribe** වෙත ගොස් ඊමේල් මගින් ව්‍යාපෘති යාවත්කාලීන ලබා ගැනීම සඳහා අනුසන් කරන්න.

# ඊස්ට් පාකෙන්හම් හි ප්‍රගතිය

## නව ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයේ වැඩ කටයුතු බලාපොරොත්තුවූ ආකාරයට හොඳින් සිදුවේ.

ජූනි මාසයේ, ඊස්ට් පාකෙන්හම් හි තාවකාලික දුම්රිය මාර්ග ස්ථාපනය කරනු ඇත. මෙම දුම්රිය මාර්ගය වෙතින් මගීන් හට අවම බාධා සිදුවන ආකාරයට නව දුම්රිය මාර්ගය ගොඩ නැගීමට අපට ඉඩ ලබා දෙනු ඇත.

ජූනි මාසයේ 24/7 වැඩ කටයුතු අවසානවීමෙන් පසු, අප විසින් නව දුම්රිය පාළම සමඟ යා කෙරෙන නව ස්ථිර දුම්රිය මාර්ග ගොඩනගනු ඇත - මෙය සිදුවන්නේ දුම්රිය ගමන දිගටම සිදුවන අතරය.

### නව දුම්රිය ස්ථානයට යටින් දිවෙන මාර්ගය

ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයට යටින් දිවෙන මගී මාර්ගය සඳහා පයිලිං සහ කැණීම් කටයුතු අවසන් කර ඇත. මාර්ග බාධක, පැනල් යෙදීම, රැම්ප් යෙදීම සහ තරප්පු තැනීම මෙන්ම ලෑන්ඩ්ස්කේප් කටයුතුද දිගටම කරනු ඇත.


ඊස්ට් පාකෙන්හම් හි දුම්රිය මාර්ග වැඩ කටයුතු.

# මාර්ග වසා ඇති කාලයේදී පළාතේ ව්‍යාපාර හට උපකාර කිරීම

Pakenham's OPEN FOR BUSINESS

**මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ් හි රථවාහන ගමනට වෙනස්කම් සිදුකර ඇති අවස්ථාවල දිගටම පාකෙන්හම් හි සාප්පු සවාරි යාම සම්බන්ධයෙන් ඔබට ස්තුතියි!**

වියදම්කර ජයගන්න යන ප්‍රයත්නය ඉතා සාර්ථක එකකි. ඵාකෙන්හම් වැසියන් බොහෝ දෙනා ප්‍රදේශයේ සාප්පු සවාරි ගොස් තරගයට ඇතුලත්වී ඇත. අපගේ ප්‍රථම ජයග්‍රාහකයා ඇයගේ වවුචරය භවිතා කර පාකෙන්හම් මෝවර්ස් ඇන්ඩ් චේන්සෝස් වෙතින් ලෝන් මෝවරයක් මිලදී ගෙන ඇත.

අනෙක් වාසනාවන්ත ජයග්‍රාහකයන් පාකෙන්හම් ජුවලර්ස්, ඉවොලියුෂන් හෙයාර් පාලර්, ද ග්‍රේට් ඕස්ට්‍රේලියන් බේක්හවුස් සහ ද චොකලට් ෂොප් පාකෙන්හම් වෙතින් වවුචර දිනා ගන්නා ලදී.

## පාකෙන්හම් ව්‍යාපෘති කියොස්කය

අපගේ නව ව්‍යාපෘති කියොස්කය පිහිටා ඇත් පාකෙන්හම් සෙන්ට්‍රල්හිය! සැලසුම් කර ඇත්තේ ළමුන් හට මිත්‍රශීලී ක්‍රියාකාරකම් මගින් ළමුන්ව විනෝදයෙන් තබන අතර සාප්පු සවාර යන්නන් හට ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමටය.

ඔබ මීළඟට පාකෙන්හම් සෙන්ට්‍රල්හි සාප්පු සවාරි යන විට මෙය සොයා බලන්න. කියොස්කය පිහිටා ඇත්තේ වූල්වර්ත්ට පිටතින්ය.



පාකෙන්හම් සෙන්ට්‍රල්හි පාකෙන්හම් ව්‍යාපෘති කියොස්කය

# පාකෙන්හම්හි පැණිරස

**පාකෙන්හම් හි චොක්ලට් ෂොප් හි පැණිරස ස්ථානයක් මේන් ස්ට්‍රීට් සාප්පු සංකීර්ණය මැද ඇත.**

ලියෝනි තෝර්න්ගේ චොක්ලට් ෂොප් 2005 දී පාකෙන්හම් හි මේන් ස්ට්‍රීට්හි විවෘත කරන ලදී. එතැන් පටන් ඇයගේ ප්‍රණීත රසකැවිලි ප්‍රජාවගේ දිනපතා කොටසක් විය. ආනන්දජනක ආනයනය කල යුරෝපීයානු චොකලට්, ලොලීස් සහ බිස්කට් මෙහි විශේෂයන්ය.

> **"සාප්පුව කුඩාවුවද එහි බොහෝ දේ ඇත" යනුවෙන් ලියෝනි පැවසුවාය. "අප සතුව විශේෂ රසකැවිලි බොහෝමයක් ඇති අතර එවා වෙන කොතැනක හෝ සොයාගත නොහැක."**

ලියෝනිව ප්‍රජාව හඳුනන්නේ ප්‍රජාවට උපකාර කරන අයෙකු වශයෙන් සහ අවශ්‍ය පරිදි සපයන හැම්පර් ලබා දෙන අයෙකු වශයෙනි. පාකෙන්හම් පුරා මිලට ගත් දේ ඇය විසින් නොමිළේ ගෙනවිත් දෙන අතර ඔබගේ විශේෂ අවස්ථාවට සරිලන ආකාරයට ඔබ මිලදී ගන්නා දෙය මනරම්ව ඔතා දෙයි.

සාප්පුව සතුව සිත්ඇදගන්නා සුළු ආකාරයට බෑග්වල දැමූ ලොලී ඇති අතර ඔබගේ අද්විතීය ත්‍යාගය දැමීම සඳහා කලෙක්ටබල් ටින් විශාල ප්‍රමාණයක් ඇත. සාප්පුව සතුව ප්‍රණීත අයිස්ක්‍රීම් වර්ග ගණනාවක් ඇති අතර ලොව පුරා ඇති රසකාරක සහිත බීම පානයන් ගණනාවක් ඇත.

ඔබට කටට රහට යමක් කෑමට අවශ්‍ය නම් හෝ විශේෂ ලෙස යම් අයෙකුට සැලකීමට අවශ්‍ය නම්, පිවිසෙන්නඃ The Chocolate Shop Pakenham 112, Main Street, Pakenham **03 5941 7165**
**thechocolateshoppakenham.com**


ලියෝනි තෝන් ඇයගේ ද චොක්ලට් ශොප්, පාකෙන්හම් සාප්පුවේදී,



# පාකෙන්හම් යකර්බු උත්සවය

**අප්‍රියෙල් 30 වන ඉරිදා පැවති යකබු උත්සවයේදී පාකෙන්හම් අවට සිදුවන විශාල ගොඩනැගිලි ව්‍යාපෘති අතර පාකෙන්හම් දුම්රිය හරහා දිවෙන මාර්ග ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රජාව හට ඉගෙනීමට අවස්ථාව ලැබුණි.**

ප්‍රජාව ආදරය කරන යකබු උත්සවය වසර 47 ක් පමණ කාලයක් පාකෙන්හම් හි තිබී ඇති අතර එහි ආරාධිත අමුත්තා යකබු මහතාය. යකබු යන වචනය ඇබොරිජිනල් වචනයක් වන අතර එහි අරුත වඩා හොඳ නිල් තණ බිම් යන්නයි. ස්වේච්ඡාවෙන් පවත්වන උත්සවය මගින් මිත්‍යා බියුනිප් සමරණ අතර එහි රයිඩ්ස්, මුහුණේ පාට ඇඳීම, පෝනියන් පිට යාම, ගිණිකෙලි ඇතුළු ළමුන් කැමති ක්‍රියාකාරකම් තිබේ.

උත්සවයට පැමිණීම, යකබු මහතා සැමරීමට උපකාර කිරීම සහ විශාල ගොඩනැගීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉගෙනීම ගැනත් අපගේ ස්තුතිය.



*පාකෙන්හම් හි උත්සවයේදී යකබු මහතා.*

## ව්‍යාපෘති කාලවකවානු

**2019**
- ස්ථාන ගවේෂණය
- තාක්ෂණික සහ ඉංජිනේරු ඇගයීම
- ප්‍රජා සහභාගිත්වය

**2021 මුල් භාගය**
- ප්‍රජා සහභාගිත්වය
- වැඩිදුර ඉංජිනේරු සහභාගිත්වය

**2021 මැද භාගය**
- දුම්රිය ස්ථාන සැලසුම් නිවේදනය කිරීම

**2021 අග භාගය**
- විවෘත අවකාශ සම්බන්ධ ප්‍රජා සහභාගිත්වය
- කල්තියා කරන වැඩ කටයුතු

**2022**
- ඉදිකිරීම
- විවෘත අවකාශ සැලසුම නිකුත් කිරීම

**2023**
- ඉදිකිරීම

**2024**
- වැඩි යහපතට බුම් ගේට්ටු ඉවත්වීම
- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන විවෘත කිරීම
- පළාත්වාසීන්ට භුක්ති විඳීම සඳහා ප්‍රජා අවකාශ විවෘත කිරීම

**කාලවකවානු වෙනස්වීම්වලට යටත්වේ*


**levelcrossings.vic.gov.au**

contact@levelcrossings.vic.gov.au

ඉංග්‍රීසි හැර වෙනත් භාෂා සඳහා, කරුණාකර දුරකථන ංංක 9209 0147 අමතන්න.

1800 105 105 (ඕනෑම අවස්ථවක අමතන්න)


මෙම තොරතුරු ප්‍රවේශවිය හැකි ආකාරයකට ලබා ගැනීම සඳහා අප හා සම්බන්ධ වන්න. ඔබට ශ්‍රව්‍ය ආබාධයක් ඇති නිසා උපකාර අවශ්‍ය නම් කරුණාකර **relayservice.gov.au** වෙත පිවිසෙන්න.


NWP9349